රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Services, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන
தொலைபேசி: (94) 011- 2696211-13
Telephone (94) 011- 2166000

ෆැක්ස්
தொலைநகல்: (94) 011- 2695279
Fax

ඊ-මේල්
மின்னஞ்சல்: information@pubad.gov.lk
E-mail

වෙබ් අඩවිය
இணையத்தளம்: www.pubad.gov.lk
Web Site

මගේ අංකය / எனது இல / My No: PS/GT – 2020 -1

ඔබගේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.08.27

## රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020

## මාර්ගගත ක්‍රමයට තොරතුරු ලබා ගැනීම

උක්ත මැයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2021.08.11 දිනැතිව පළ කරන ලද නිවේදනය සහ ඒ සම්බන්ධයෙන් වූ මාගේ 2021.08.20 දිනැති ලිපිය හා බැඳේ. ඒ අනුව මාර්ගගතව තොරතුරු ඇතුළත් කරන උපාධිධාරීන් පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.

02. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ පළාත් සභා යටතේ වන ආයතනවල පුහුණුව ලබන අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ තොරතුරු ඇතුළත් කිරීමේදී මාර්ගගත දත්ත පත්‍රිකාවේ පුහුණු සේවා ස්ථානය (3 (xii) ) ඇතුළත් කිරීමේ දී,

- ජාතික පාසල්වල පුහුණුව ලබන්නේ නම් පුහුණු සේවා ස්ථානය අධ්‍යාපන අමාත්‍යාංශය වේ.
- පළාත් පාසල්වල පුහුණුව ලබන්නේ නම් පුහුණු සේවා ස්ථානය අදාළ පළාත් සභාව වේ.
- අර්ධ රාජ්‍ය ආයතනයක/ රජයේ ව්‍යාපෘතියක පුහුණුව ලබන්නේ නම් පුහුණු සේවා ස්ථානය එම ආයතනය අයත් අමාත්‍යාංශ වේ.

සැ.යු. මේ වන විටත් තොරතුරු ඇතුළත් කරන ලද අභ්‍යාසලාභී උපාධිධාරීන් විසින් ඉහත කරුණු සම්බන්ධව වෙනත් තොරතුරු ඇතුළත් කර ඇත්නම් ඒ සම්බන්ධයෙන් වන සංශෝධනය සඳහා පසුව ඉඩ සලසනු ලැබේ.

03. නැවත දත්ත ඇතුළත් කිරීමට අවස්ථාව ලබා දිය හැක්කේ තාක්ෂණික කරුණු මත දත්ත ඇතුළත් කිරීමට නොහැකි උපාධිධාරී අභ්‍යාසලාභීන්ට පමණක් බැවින් තමාට නියමිත දිනයේ දී ම දත්ත ඇතුළත් කිරීමට හැකිතාක් උත්සාහ කරන්න.

04. භාවිත නාමය (user name), මුරපදය (password) හෝ හැඳුනුම්පත් අංකය සම්බන්ධ ගැටලු හේතුවෙන් මෘදුකාංගයට පිවිසීමට නොහැකි අභ්‍යාසලාභීන්ට එම තොරතුරු ඇතුළත් කිරීමට පසුව අවස්ථාව සලසා දෙනු ලැබේ.

05. තොරතුරු ඇතුළත් කිරීමෙන් අනතුරුව “print” යන්න එක් වරක් click කළ පසු සම්පූර්ණ කරන ලද අයදුම්පත දිස්වන අතර ඇතුළත් කළ තොරතුරුවල නිරවද්‍යතාවය එමගින් පරික්ෂා කරගත හැකිය. යම් ගැටලුවක් ඇත්නම් පමණක් එම අවස්ථාවේ දී ම අදාළ වෙනස්කම් සිදු කරන්න.

06. මෘදුකාංගයට ඇතුළත්වීමේ දී (login) උපාධිධාරී අභ්‍යාසලාභීන් භාවිත කළ යුත්තේ රාජ්‍ය සේවා ලේකම්ගේ 2021.08.11 දිනැති ලිපියේ අංක යටතේ පළ කරන ලද “සැබැඳි” (links) පමණක් බව සලකන්න.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙනුවට